සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2018 වර්ෂය සඳහා වූ ආයුර්වේද සිද්ධා යුනානි වෛද්‍යවරුන්ගේ නාමලේඛනයක් භාෂාත්‍රයෙන්ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,158 - 2020 ජනවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 08 |
| විවිධ දැන්වීම් ... ... ... ... | 09 |

*සැ. යු.* - (i) විසි දෙවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) විසිඑක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 ජනවාරි මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජනවාරි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

07- B 081596 — 353 (2020/01)
D 1 -

# පිස්කල් විකිණීම්

## මහනුවර දිසා අධිකරණයේ දී ය

## ප්‍රසිද්ධ පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

ටී. කේ. එස්. ෆයිනෑන්ස් ලිමිටඩ්,
අංක 245, ධර්මපාල මාවත,
කොළඹ 07.
(සමාගමේ නව අංකය : පී. බී. 3793)

*නඩු අංකය* : DMB/16/15/(කොළඹ දිසා අධිකරණය)
*නියමිත විශේෂ වටිනාකම* : රු. 7,762,257.01
*ඇස්කිසි අංකය* : 17/19 (මහනුවර දිසා අධිකරණය)

......................*පැමිණිලිකරු*

*එදිරිව*

1. හැළඹ ආරච්චිගේ, ජයතු පියසිරි,
   අංක 04, දේවි පාර,
   වටපුළුව, මහනුවර.

2. දෝන අරුණි සුජීවා ලියනපතිරණ,
   අංක 04, දේවි පාර,
   වටපුළුව, මහනුවර.

......................*විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩු වාර්තාවේ ඇතුළත් කර ඇති වර්ෂ 2016.06.14 වන දින කොළඹ දිසා අධිකරණයේ තීන්දු ප්‍රකාශය අනුව 1 වන සහ 2 වන විත්තිකරුවන්ගෙන් රු. 7,762,257.01 ක මුදල මත වර්ෂ 2014 ක් වූ නොවැම්බර්, මස 28 වන දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමවනතුරු ඒ මුළු මුදල මත නෛතික පොලිය ව්‍යවස්ථාගත ගාස්තු සහ නඩුගාස්තුද ගෙවන ලෙසටත් නියෝගකොට ඇති අතර, ඉහත සඳහන් 1 වන සහ 2 වන විත්තිකරුවන්ට අයත්ව ඇති පහත උපලේඛනයේ විස්තර කර ඇති පැමිණිලිකාර සමාගමට උකස්කරන දේපළ තහනමට ගෙන ඒවා විකුණා එම මුදල් අයකර දෙන ලෙසද ආඥාකොට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එල්. වී. ද සිල්වා විසින් සහතික කල වර්ෂ 2013.07.02 දිනැති අංක 1177 දරන බැඳුම්කරය පදනම් කරගෙන ඉහත කී රු. 7,762,257.01 ක මුදල මත වර්ෂ 2014 ක් වූ නොවැම්බර් මස 28 වන දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමවන තුරු ඒ මුළු මුදල මත නෛතික පොලිය ව්‍යවස්ථාගත ගාස්තු සහ නඩු ගාස්තු ද ගෙවන ලෙසටත් 1 වන සහ 2 වන විත්තිකරුවන්ට නියෝගකොට ඇති බැවින් ද, ඒ අනුව කටයුතු කිරීමට 1 වන සහ 2 වන විත්තිකරුවන් අපොහොසත් හා හෝ පැහැර හැර ඇති බැවින්ද, DMB 16/2015 කොළඹ දිසා අධිකරණ නඩුවේ තීන්දු ප්‍රකාශය අනුව මහනුවර දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල් වන මා වෙත නිකුත් කරන ලද විකිණීමේ අධිකාරී බලපත්‍රය මත පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ වර්ෂ 2020 ක් වූ පෙබරවාරි මස 06 වන දින ප.ව. 1.00 කනිසමට විකිණීමේ අධිකාරී පත්‍රයේ සඳහන් ආකාරයට කලින් *ගැසට්* හා පුවත්පත් මගින් නිවේදනය කරමින් නිවේදන දැන්වීම් හා බෙදා හැරීමෙන් පසුව දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මා විසින් කටයුතු කරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟවට කෝරළේ මහනුවර මහානගර සභා සීමාවට අයත්, මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වටපුලුව බටහිර අංක 229 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වටපුළුව ග්‍රාමයේ පිහිටි ගල්කඩුව වත්ත *හෙවත්* ගල්ලින්ද වත්ත, පිටකන්ද වත්ත පිටකන්ද නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩබ්. එම්. වික්ටර් මාපිටිගම මහතා විසින් වර්ෂ 2012.12.16 වන දින මැන සාදන ලද අංක 684 දරන පිඹුරේ ලොට් 1 දරන ඉඩමට මායිම් උතුරට : කැබලි අංක 02 ද, නැගෙනහිරට : කැබලි අංක 04 ද, දකුණට : ගල්කඩුව හංදියේ සිට අරුප්පලට ගමන් ගන්නා ධර්මාශෝක මාවත ද, බස්නාහිරට : දේවි පාර ද, (සාමාන්‍යයෙන් පරණ ගංතොට පාර ලෙස හඳුන්වන) මායිම් වූ අංක 684 පිඹුර අනුව පර්චස් දහනවයයි දශම එකයි තුනක් ද, (පර්. 19.13) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බින්දුවයි හතරයි අටයි හතරක් විශාල සහ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A 467/16 යටතේ ලියාපදිංචිකර ඇති ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි, පස, ගහකොළ ආදී සියලු දේත් වේ.

කැබලි අංක 01 සඳහා මායිම්,

උතුරට : කැබලි අංක 02 ද,
නැගෙනහිරට : කැබලි අංක 04 ද,
දකුණට : ගල්කඩුව හංදියේ සිට අරුප්පලට ගමන් ගන්නා ධර්මාශෝක මාවත ද,
බස්නාහිරට : දේවි පාර ද (සාමාන්‍යයෙන් පරණ ගංතොට පාර ලෙස හඳුන්වන)

**ඉහත සඳහන් දේපළට පිවිසෙන මාර්ගය**

මහනුවර සිට කටුගස්තොට පාරේ කි. මී. 1 1/2 ක් ගිය පසු මහයියාව හංදියෙන් හැරී එතැන් සිට අරුප්පල පාරේ මීටර් 600ක් ගිය පසු ගල්කඩුව හංදියේ වම්පස මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- ඉහත සඳහන් වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම ඒ අවස්ථාවේදීම පහත සඳහන් මුදල් රෙජිස්ට්‍රාර්ට/නියෝජ්‍ය පිස්කල්ට මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 25%
2. ගැනුම් මිලෙන් පළමු රු. 7,500.00 සඳහා රු. 150.00 ක් ද හා ඊට වැඩිවන සෑම රුපියල් 1,000.00 කොටසකට රු. 5.00 බැගින් ද වශයෙන් කණු ගාස්තු ද ගෙවිය යුතු ය.
3. වෙන්දේසිය සඳහා දරන සියළු වියදම් ද ගැනුම් මිලෙහි ශේෂය වන 75% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත මහනුවර දිසා අධිකරණයේ ඇස්කිසි අංක 17/2019 යටතේ හා කොළඹ දිසා අධිකරණයේ නඩු අංක DMB 16/2015 නඩුවේ බැරට මහනුවර දිසා අධිකරණයේ තැන්පත් කළ යුතු ය.
4. අධිකරණය මගින් විකිණීම ස්ථිර කිරීමෙන් පසුව ගැණුම්කරු විසින් සිය මුදලින් මුද්දර ගාස්තු ගෙවා පිස්කල් පැවරුම්, ඔප්පුව පවරාගත යුතු ය.

හිමිකම් සහ ඔප්පු ලිය කියවිලි පරීක්ෂා කිරීම සඳහා අංක 245 ධර්මපාල මාවත, කොළඹ 07 දරන ස්ථානයේ පිහිටි ටී. කේ. එස්. ෆයිනෑන්ස් ලිමිටඩ් හි අයකිරීමේ කළමණාකරු 011-4799999 හෝ 076-8271151 දුරකථන අංක අමතන්න.

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය මහනුවර.

2019 ක් වූ දෙසැම්බර් මස 19 වැනි දින දී ය.

---

# විවිධ දැන්වීම්

## ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාත්බඳ කොළඹ මහාධිකරණයේ දී ය

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන අධිකරණය මගින් ඈවර කිරීමක් සම්බන්ධ කාරණාවේ දී ය.

*නඩු අංකය* : 80/2019/CO

1. ශාන්ත රුවන් කුමාර ලියනගේ,
අංක 221/1/M
සුප්‍රිම් ටෙරස්,
කුරුකුලාව, රාගම.

.....................*පෙත්සම්කරු.*

- *එදිරිව* -

ස්මාර්ට් ලොජිස්ටික්ස් (පුද්ගලික) සමාගම,
F10, ලෙවල් 01,
තිලක්මා සිටි, අංක 588,
මීගමුව පාර, මහබාගේ.

වසා දැමීමට යෝජිත සමාගම.

බස්නාහිර පළාතේ වානිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක්, 2019 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ, වරුනි කුමාරපේලි විසින් ඉදිරිපත් කර ඇති බවද, එකී පෙත්සම 2020 ක් වූ ජනවාරි මස 29 වන දින අධිකරණය ඉදිරියෙහි විභාග කරනු ලැබීමට නියම කර ඇති බවද එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ග

යෙන් හෝ පෙනී සිටිය හැකි බවද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බවද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

වරුනි කුමාරපේලි,
පෙත්සම්කරුවන් නීතිඥ,
අංක 15, බෙල්මන්ට් වීදිය, කොළඹ 12.

*සටහන.-* එකී පෙත්සම විභාග කරන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ වරුනි කුමාරපේලි වෙත භාරදිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2020 ක් වූ ජනවාරි මස 28 වැනි දින සවස. 6.00ට පෙර ලැබෙන ලෙස භාරදිය යුතු ය. *නැතහොත්* තැපැලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතු ය.

01-410

---

## පෙත්සම පිළිබඳ දැන්වීම

කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද වානිජ මහාධිකරණයේ දී ය

හෝකන්දර, හෝකන්දර දකුණ, අංක 69/1 හි ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ඉෂාරා ඉංජිනියර්ස් ඇන්ඩ් ලොරි බොඩි (ප්‍රයිවට්) ලිමිටඩ් හි ඇවර කිරීම කාරණාව සම්බන්ධවයි.

*නඩු අංකය* : HC (Civil)/58/2019/CO

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ 270(අ) සහ/හෝ (ඉ) සහ/හෝ (ඊ) යන වගන්ති යටතේ ඉෂාරා ඉංජිනියර්ස් ඇන්ඩ් ලොරි බොඩි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසුරුවා හැරීම සඳහා 272(1) වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

ඉෂාරා ඉංජිනියර්ස් ඇන්ඩ් ලොරි බොඩි (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 69/1, හෝකන්දර දකුණ,
හෝකන්දර.

..............................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් සමාගම ඇවර කිරීම සඳහා වර්ෂ 2019 ක් වූ ජූලි මස 25 වන දිනැති පෙත්සමක්, කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද වානිජ මහාධිකරණයේ ඉහත නම් සඳහන් පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ එස්. එන්. රාජපක්ෂ මිය විසින් ඉදිරිපත් කරනු ලැබ, වර්ෂ 2020 ක් වූ ජනවාරි මස 14 වැනි දින එකී අධිකරණයේ දී, ඒ පිළිබඳව විමසීමට නියම කිරීම සඳහා කැඳවන අතර, ඒ පිළිබඳව එකී සමාගමේ ණය හිමියකු හෝ සහදායකයකු විසින් එකඟත්වය හෝ විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට කැමැත්තෙහි නම්, එවැනි යම් ණය හිමියකු හෝ සහදායකයෙකු විසින් පුද්ගලිකව පෙනී සිට හෝ නීතිඥයකු මගින් ඒ සඳහා පෙනී සිටිය යුතු වන අතර, එකී සමාගමේ යම් ණය හිමියකු හෝ සහදායකයකු හට පෙත්සමේ පිටපත් නියමිත ගාස්තු ගෙවීමෙන් පසු පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකිය.

නීතිඥ එස්. එන්. රාජපක්ෂ මිය,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 700/120, පෙරේරා මාවත, තලවතුගොඩ.

*සටහන.-* යම් පුද්ගලයකු එකී පෙත්සම පිළිබඳ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන්නේ නම්, ඒ බව නීතිඥ එස්. එන්. රාජපක්ෂ මිය වෙත ලිඛිතව දැන්වීම් භාරදීමෙන් හෝ තැපැල් මගින් හෝ දන්වා සිටිය යුතු අතර, එම දැන්වීමේ යම් පුද්ගලයකු නම්, නම සහ ලිපිනය ද, ආයතනයක් නම් ආයතනයේ නම සහ ලිපිනය ද, දක්වා පුද්ගලයා විසින් හෝ ආයතනය විසින් හෝ ඔවුන්ගේ නීතිඥවරයා (සීටිනම්) විසින් අත්සන් තබා භාරදිය යුතු අතර තැපැලෙන් එවන්නේ නම්, අවශ්‍ය කාලසීමාව ඇතිව වර්ෂ 2020 ක් වූ ජනවාරි මස 13 වැනි දින ප.ව. 6.00 ට පෙර ඉහත සඳහන් නීතිඥ තැන වෙත භාර දිය යුතු බව ද දන්වා සිටිමි.

01-486

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.